# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2146/40 - 2019 ඔක්තෝබර් මස 27 වැනි ඉරිදා - 2019.10.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**මැතිවරණ කොමිෂන් සභාව විසින් අංක 2142/47 දරන 2019.09.25 දිනැතිව *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙන්* නිකුත්කරන ලද ඡන්ද විමසීම්වල දී තරග කරනු ලබන දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම්/අපේක්ෂකයන් විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම පද්ධතිය හා සම්බන්ධිතව මැතිවරණ කොමිෂන් සභාව විසින් අමතරව නිකුත්කරනු ලබන ආචාර ධර්ම**

1. ඡන්ද මධ්‍යස්ථානයක් තුළ හෝ තැපැල් ඡන්ද මධ්‍යස්ථානයක් තුළ ඡායාරූප ගැනීමෙන්, වීඩියෝ ගත කිරීමෙන් වැළකී සිටිය යුතු ය. යම් හෙයකින් එසේ ඡායාරූප හෝ වීඩියෝ දර්ශන ලබාගැනීම හෝ වෙනත් අයෙකු විසින් ලබාගත් ඡායාරූප හෝ වීඩියෝ දර්ශන විද්‍යුත්, මුද්‍රිත හෝ සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධියට පත්කිරීම හෝ බෙදාහැරීම හෝ අනුබල දීම නොකළ යුතු ය.

2. දේශපාලන අයිතිවාසිකම් අහිමි රාජ්‍ය නිලධාරින්ගේ හා සක්‍රිය සේවයේ යෙදී සිටින ආරක්ෂක හමුදා හා පොලිස් නිලධාරින්ගේ මෙන්ම විශ්‍රාමික ආරක්ෂක හමුද නිලධාරින් හෝ පොලිස් නිලධාරින් සේවයේ යෙදී සිටිය දී ලබාගන්නා හෝ නිල ඇඳුමෙන් සැරසී ලබාගන්නා ඡායරූප හෝ ප්‍රකාශ, පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනය වන ආකාරයට හෝ අගතියට පත්වන ආකාරයට විද්‍යුත්, මුද්‍රිත හෝ වෙනත් මාධ්‍ය හෝ ප්‍රචාරක මාධ්‍යයක් තුළින් ප්‍රකාශ කිරීම, විකාශය කිරීම හෝ ප්‍රසිද්ධියට පත්කිරීම සඳහා භාවිතා කිරීම නොකළ යුතු ය.

3. දේශපාලනඥයන් සඳහා වෙන්කර දී ඇති රජයේ නිල නිවාස, පක්ෂ හෝ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා ඡන්ද කාර්යාල ලෙස භාවිතා නොකළ යුතු ය. එමෙන්ම එවැනි නිල නිවාස තුළ ඡන්ද විමසීම් නීතිරීතිවලට හෝ කොමිෂන් සභාව විසින් ගැසට් මගින් නිවේදනය කරනු ලැබ ඇති විධානවලට පටහැනි කිසිදු වරදක් හෝ දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු නොකළ යුත්තේ ය.

මහින්ද දේශප්‍රිය,
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

එන්. ජේ. අබේසේකර,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

එස්. රත්නජීවන් එච්. හූල්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2019 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ දීය.

11 - 1033


1A - PG 4724 — 267 (2019/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*